www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ‘කීර්ති සහෝදරයා අප සියල්ලන් තුල ම ජීවත් වෙයි’

## - ඩේවිඩ් නොර්ත් කීර්ති සහෝදරයාගේ අවමංගලෝත්සවයේ දී

**Speech made by David North at the funeral of Keerthi Balasuriya**

**ඩේවිඩ් නෝර්ත්**
**1987 දෙසැම්බර් 23**

*ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ආරම්භයේ පටන් ම එහි ප්‍රධාන ලේකම්ව සිටි කීර්ති බාලසූරිය සහෝදරයා 1987 දෙසැම්බර් 18 දා කොලඹ විකොස කාර්යාලයේ වැඩ කරමින් සිටිය දී වැලඳුනු හදිසි හෘදයාබාධයකින් අභාවයට පත් විය. 1987 දෙසැම්බර් 23 දා කොලඹ කනත්තේ දී පැවති ඔහුගේ අවමංගලෝත්සවයේ දී ඇමරිකානු වර්කර්ස් ලීගයේ (වත්මන් සමාජවාදී සමාජවාදී සමානතා පක්ෂයේ) ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් කල කතාව අපි පහත පල කරමු.*

විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම කාරක සභාවෙහි සහෝදරවරුනි, කීර්ති බාලසූරිය සහෝදරයාගේ ජීවිතයට ගෞරව දැක්වීම සඳහා අද මෙහි පැමින සිටින සහෝදරවරුනි, ඔහුගේ ධෛර්ය සම්පන්න යාවජීව සහකාරිය වූ විලානි සහෝදරියඃ

අද අප රැස්ව සිටින්නේ අපගේ ශ්‍රේෂ්ඨතම සහෝදරයන්ගෙන් කෙනෙකුගේ මෘත දේහය අබියස ය. අද අප මෙහි රැස්ව සිටිතත් අප අතරින් කිසි ම කෙනෙක් මෙවැන්නක් සිදුව ඇතැයි විශ්වාස කිරීමට සත්තකින් ම අකමැති වෙත්. අප අපේක්ෂා කරන්නේ මෙය හුදෙක් කිසි යම් ආකාරයක දුෂ්ට ස්වප්නයක් පමනක් බවත්, අප ඉන් අවදි වන විට ලෝක සමාජවාදී විප්ලවය සඳහා අරගලයෙහි අපට නායකත්වය දෙමින් කීර්ති සහෝදරයා අප පසෙකින් සිටිනු ඇති බවත් ය. එහෙත් කීර්ති සහෝදරයා අපෙන් බැහැර කෙරී ඇතැයි අප විසින් පිලිගත යුතු බව අපි දනිමු. වයස තිස්නවයෙහි දී, ඔහුගේ මරනය ඕනෑවට වඩා කඩිනමින් පැමින ඇත. මේ අවස්ථාවෙහි මම ඔහුගේ අපරිනත මරනයට දායක වීම සම්බන්ධයෙන් කම්කරු විප්ලවවාදී පක්ෂයේ භ්‍රෂ්ටයන්ට - විශේෂයෙන් ම හීලිට, බන්ඩාට සහ ස්ලෝටර්ට - ප්‍රසිද්ධියේ චෝදනා කිරීමට කැමැත්තෙමි.

කීර්ති සහෝදරයා ද, විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයෙහි සාමාජිකයන් ද, අරගලයෙහි නිරතව සිටි දුෂ්කර තත්ත්වයන් ගැන මුලුමනින් ම නො තකා හරිමින්, ඔහුගේ විප්ලවීය මූලධර්මවලට මුලුමනින් ම හතුරුව, මෙම ද්‍රෝහීහු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය හුදෙකලා කිරීමට හා අවමානයට පාත්‍ර කිරීමට ද, විනාශ කිරීමට පවා ද යත්න දැරූහ. ඔවුහු වෙසෙසින් ම කීර්ති සහෝදරයා ඉතා ම අශ්ශීල අපහාසයන්ට පාත්‍ර කලහ. ඔවුන් නිර්මානය කිරීමට මාන බැලූ කොන්දේසි ඔහුගේ කායික සෞඛ්‍යය කෙරෙහි බලපෑමක් කල බවට කිසි ම සැකයක් නැත.

එහෙත් ඔවුන්ට ඇතැම් විට ඔහුගේ හෘදය වස්තුව දුර්වල කිරීමට පුලුවන් වුවත්, ඔහුගේ විප්ලවවාදී ආත්මය බිඳ දැමීමට නුපුලුවන් විය. අවසාන වශයෙන්, භ්‍රෂ්ටයන්ට තීරනාත්මක පරාජයක් අත්පත් කර දුන්නේ කීර්ති සහෝදරයාත් ජාත්‍යන්තර කමිටුවේ නායකත්වයත් ය.

කීර්ති සහෝදරයාගේ මරනයෙන් අපට නැති වී ගිය දෙය වටහා ගැනීමට නම් ඔහුගේ ජීවිතයෙන් අපට අත් වූ දෙය වටහා ගත යුතු ය. කීර්ති සහෝදරයාගේ මුලු මහත් ජීවිතය ම කැප කෙරුනේ මුලින් ම ට්‍රොට්ස්කි විසින් විවරනය කෙරුනු දැවැන්ත ඓතිහාසික ප්‍රශ්නය විසඳා ලීමට යඃ එනම්, කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය පිලිබඳ අර්බුදය විසඳා ලීමට ය.

ඔහු විප්ලවවාදී දේශපාලනයට ප්‍රවේශ වූ දිනයේ පටන් ම ඔහු මිය ගිය දිනය දක්වා ම ඔහුගේ සමස්ත ජීවිතය බැඳී පැවැත්තේ මහා පාවා දීම් දෙකක ඓතිහාසික ඇඟවීම් ජය ගැනීම සමග ය. එනම් ශ්‍රී ලංකාවේ සමසමාජ පක්ෂයේ පාවා දීම හා එක්සත් ජනපදයෙහි සමාජවාදී කම්කරු පක්ෂයේ පාවා දීම ය.

ට්‍රොට්ස්කිගේ අභාවයෙන් අනතුරුව හතර වන ජාත්‍යන්තරයේ වර්ධනය සම්බන්ධයෙන් එතරම් වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කොට තිබුනු මෙම කන්ඩායම් දෙක 1963-1964 වන විට හතර වන ජාත්‍යන්තරය ගොඩ නැංවී තිබුනු මූලික මූලධර්ම සියල්ල ම ප්‍රතික්ෂේප කොට තිබුනි. ඔවුහු ජාත්‍යන්තර

සමාජ විප්ලවයේ ඉදිරි දර්ශනය අත් හැර දමා, කම්කරු පන්ති ව්‍යාපාරය මත මුදා හැරුනු ඉතා ප්‍රතිගාමී පීඩනයන් සියල්ලට අනුගතව සිටියහ. කම්කරු පන්තියේ විප්ලවීය කාර්ය භාරය පිලිබඳ විශ්වාස භංගත්වයට පත්ව සිටි ඔවුහු සමාජවාදයට එක ම පාර වැටී ඇත්තේ ලෝක විප්ලවය හා නිර්ධන පන්ති ඒකාධිපතිත්වය ඔස්සේ බව අමතක කර දැමීමට ඉටා ගත්හ.

ලංකා සමසමාජ පක්ෂය බන්ඩාරනායක මහත්මිය සමග සභාග ආන්ඩුවකට ඇතුල් වූ අතර, සමාජවාදී කම්කරු පක්ෂය පැබ්ලෝවාදීන් සමග යලි එකමුතුව කැස්ත්‍රෝ සහ වෙනත් සුලු ධනේශ්වර නායකයන් කම්කරු පන්තියට හා එහි විප්ලවවාදී පක්ෂයට විකල්පයක් විය හැකි ය යි පිලිගත්තේ ය.

ශ්‍රී ලංකාවෙහි කම්කරු පන්ති ව්‍යාපාරය මත දිරිය සිඳුවනසුලු ගැඹුරු බලපෑමක් ඇති කල මෙම ඓතිහාසික පාවා දීම හමුවෙහි කීර්ති සහෝදරයා නායකත්වයෙහි ඇතිව විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ගොඩ නැංවූවෝ ලංකා සමසමාජ පක්ෂයෙහි බංකොලොත් ඉදිරි දර්ශනය ප්‍රතික්ෂේප කලහ.

ට්‍රොට්ස්කි සටන් වැදුනු ඉදිරි දර්ශනයෙහි විද්‍යාත්මක නිරවද්‍ය භාවය ගැන කීර්ති සහෝදරයා බැරෑරුම් ලෙස ඒත්තු ගෙන සිටියේ ය. මාඕ සේ-තුං, හෝ චි මිං සහ ෆිදෙල් කස්ත්‍රෝ යනාදින්ගේ 'ජයග්‍රහනවලින්' සුලු ධනේශ්වර පෙරලිකාරයන් තෘප්තිමත් වූ අතර, කීර්ති සහෝදරයා දැඩිව කියා සිටියේ මෙම ග්‍රහලෝකය මත පවතින එක ම තිරසර විප්ලවීය බලවේගය ලෙස සලකා මාක්ස්වාදීන්ගේ දේශපාලනික නැඹුරුව කම්කරු පන්තිය දිශාවට ම විය යුතු බව ය.

තමන් ද තම සහෝදරයන් ද මුහුන දුන් ක්ෂනික පීඩනයන් ඔහු මුලුමනින් ම නො තකා හැරියේ ය. පවතින මනෝගතීන්ට අනුගත නොවූ ඔහු, ට්‍රොට්ස්කිවාදයේ ඉදිරි දර්ශනය සඳහා අරගලය කෙතරම් මහත් වූ දුෂ්කරතා යටතේ වුව කම්කරු පන්තිය තුලට රැගෙන යා යුතු බව අවධාරනය කලේ ය.

ඔහු සුලු ධනේශ්වර පෙරලිකාරිත්වයට හා ස්ටැලින්වාදයට කුමන ආකාර හෝ යටත් වීමක් ප්‍රතික්ෂේප කල අතර, පශ්චාත් දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයෙහි ධනේශ්වර ජාතිකවාදය අධිරාජ්‍යවාදය අබිබවා කෙසේ හෝ ජයග්‍රහනය කොට ඇතැයි යන මුසාව පිලිගැනීම ද ප්‍රතික්ෂේප කලේ ය.

ඔහු තුල අධිරාජ්‍යවාදයේ ජාතික පක්කලියන් කෙරෙහි අවඥාවකට වැඩි දෙයක් නො වී ය. දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයෙන් අනතුරුව පිහිටුවනු ලැබුනු විවිධාකාර රාජ්‍යයන් පිලිබඳ නිර්ලජ්ජ උත්කර්ෂවත් වර්ණනයන්ට සහභාගි වීම කීර්ති විසින් ප්‍රතික්ෂේප කෙරුනි! කීර්ති සහෝදරයාට මෙම අවජාතක රාජ්‍ය වර්ගවාදයට හා පීඩනයට සමාන අරුත් දරන්නේ විය. ට්‍රොට්ස්කි සහෝදරයා උගැන්වූ දේ ඔහු ගැඹුරින් ම විශ්වාස කලේ ය. එනම් පසුගාමී රටවල් හමුවේ පැවති ප්‍රජාතාන්ත්‍රික කර්තව්‍යයන් නිර්ධන පන්ති විප්ලවයේ පදනම උඩ පමනක් ම සාක්ෂාත් කර ගත හැකි වන බව ය.

ලංකාව තුල ජාත්‍යන්තර කමිටුවෙහි ශාඛාවක් ගොඩ නැංවීමේ අරගලයට ඔහු උර දුන්නේ මෙම ඉදිරි දර්ශනයට සටන් කිරීම සඳහාත් මෙම රට තුල ට්‍රොට්ස්කිවාදයේ අඛන්ඩත්වය අලුත් කොට යලි තහවුරු කිරීම සඳහාත් ය.

ඒ නිසා ම, ජාත්‍යන්තර කමිටුව තුල කම්කරු විප්ලවවාදී පක්ෂයේ අවස්ථාවාදී පිලිවෙත පිලිබඳව මුල් ම විවේචන නැංවූයේ කීර්ති සහෝදරයා වීම, කිසි සේත් ම අහම්බයක් නො වේ. 1971 තමා තරුනයෙකුව සිටිය දීත් ඔහු ඉන්දියානු හමුදාව බංග්ලාදේශය ආක්‍රමනය කිරීම මයිකල් බන්ඩා විසින් ආරක්ෂා කරනු ලැබීමට විරුද්ධව නැඟී සිටියේ ය. මෙම විවේචන හීලි, බන්ඩා සහ ස්ලෝටර් විසින් මැඩ පවත්වනු ලැබින. අනතුරුව එලඹුනු වසර ගනනාව තුල ඔවුහු, එම විවේචන කිරීමට තරම් එඩිතර වීම සම්බන්ධයෙන් විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට දඬුවම් කිරීමට ක්‍රමානුකූලව ක්‍රියා කලහ. විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට හා කීර්ති සහෝදරයාට විරුද්ධව ඔවුන්ගේ ක්‍රියා පටිපාටීන්හි වාර්තාව හදාරන විට කෙනෙකුට අවස්ථාවාදය නිමාවට පත් වන්නේත් ප්‍රකෝපකාරිත්වය ආරම්භ වන්නේත් කොතැනින් දැයි වටහා ගත නොහැකි වෙයි.

එහෙත් මෙම අවස්ථාවාදීන්ටත් බ්‍රිතාන්‍ය ස්වෝත්තමවාදීන්ටත් කීර්ති සහෝදරයා ජාත්‍යන්තර කමිටුවෙන් නෙරපීමට නුපුලුවන් විය. වර්කර්ස් ලීගය විසින් කම්කරු විප්ලවවාදී පක්ෂය පිලිබඳව කරනු ලැබුනු දේශපාලනික විවේචන ගැන 1985 දී ප්‍රථම වරට දැන ගන්නට ලැබුනු විට ඔහු වහා ඊට සිය සහයෝගය පල කලේ ය.

කීර්ති සහෝදරයා සමග පසු ගිය දෙවසර තුල වැඩ කල සියල්ලන් ම අරගලයට ඔහුගේ දායකත්වය පරම වශයෙන් ම තීරනාත්මක වූ බව නිරවශේෂයෙන් පිලිගනු ඇත. පසු ගිය දෙවසර තුල, එනම් 1985 ඔක්තෝබර් සිට 1987 නොවැම්බර් දක්වා කාලය අතරතුර ඔහු හත් වතාවකට නොඅඩුව ජාත්‍යන්තර කමිටුවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා යුරෝපයට ගියේ ය.

සිය ගනන් පිටුවලට දිවෙන ලිපිලේඛන ප්‍රමානයක් කෙටුම්පත් කිරීමට ඔහු සහභාගි විය. එම කටයුතුවල නිරතව සිටින විට ඔහට වෙහෙස නොදැනුනි. ශ්‍රී ලංකාව තුල බලපවත්වන අතිශය ආතති සහගත තත්ත්වයෙන් පැන නගින සියලු ම අතිමහත් පීඩනයන් තිබිය දීත්, කීර්ති ජාත්‍යන්තර කමිටුව එහි ශාඛාවන් පවතින සියලු ම රටවල දී අත්පත් කර ගන්නා වර්ධනය පිලිබඳව අතිමහත් වූ අවධානයක් දැක්වී ය. මෙම රටෙහි කම්කරු පන්තියේ ප්‍රශ්න කෙරෙහි දැක්වූ ආසක්ත භාවයට අඩු ආසක්ත භාවයක් නො වේ ඔහු, ඇමරිකානු, ජර්මානු, බ්‍රිතාන්‍ය සහ ඕස්ට්‍රේලියානු කම්කරු පන්තීන් කෙරෙහි දැක්වූයේ.

සෑම රටක ම කම්කරු පන්තියෙහි අරගලවල අන්තර් සම්බන්ධිත භාවය පිලිබඳව කීර්ති ඒත්තු ගෙන සිටි හෙයින් ඔහු මේ සියලු ම රටවල ජාත්‍යන්තර කමිටු ශාඛාවන්හි ඉදිරි දර්ශන සාකච්ඡා කිරීම සඳහා අපමන පැය ගනන් ගත කලේ ය. කම්කරු පන්ති අරගලවල ජාත්‍යන්තරවාදී භාවය ඔහු වචනයෙහි ඉතා ම පරිසමාප්ත විද්‍යාත්මක අර්ථයෙන් වටහා ගෙන සිටියේ ය. ලෝක ආර්ථිකයක් හා බහුජාතික නිෂ්පාදනයක් පවතින මෙම යුගයෙහි සියලු ම රටවල කම්කරු පන්තික අරගල එක ම ජාත්‍යන්තර මූලෝපායකින් මග පෙන්වනු ලැබිය යුතු බව ඔහු වටහා ගෙන සිටියේ ය.

මේ අනුව, මෙම අර්ථයෙන් ගත් කල්හි, කීර්ති සහෝදරයාගේ චින්තනය මුලු ලෝක ගෝලය වැලඳ ගෙන සිටියේ ය. සත්තකින් ම ඔහු අභාවප්‍රාප්ත වීමට පෙර දිනයේත් ජාත්‍යන්තර ඉදිරි දර්ශනයක් කෙටුම්පත් කිරීම සඳහා වර්කර්ස් ලීගය හා සහයෝගයෙන් ක්‍රියා කිරීමට එක්සත් ජනපදයට යාමට කටයුතු සූදානම් කරමින් සිටියේ ය.

එහෙත් එය එසේ සිදු නො වනු ඇත. අපට කීර්ති සහෝදරයාගේ කායික සහභාගිත්වය නැතිව ගොස් ඇත. එහෙත් කීර්ති සහෝදරයා අප සියල්ලන් තුල ජීවත් වන බව අද අපට පැවසිය හැකි ය. කීර්ති සහෝදරයාගේ ජීවිතය හා වැඩ කටයුතු මගින්, අප, ඉදිරියේ එලඹෙන අරගලවලට සූදානම් කෙරී ඇති බව ඓතිහාසික ඉදිරි දර්ශනයක මට්ටමට නැග ගත හැකි ඕනෑ ම කෙනෙකු අද මෙම අවමංගල්‍යෝත්සවයේ දී පවා වටහා ගන්නවා ඇත.

අතිනුදුරින් එලඹෙන කාල පරිච්ඡේදයේ දී ම, ආසියාවෙහි පමනක් නො ව ලෝකය පුරා ම කම්කරුවන්, කීර්ති සහෝදරයාගේ ලියවිලි කියවීම ද හැදෑරීම ද කරනු ඇත. තරුනන්ගේ ගුරුන් බවට පත් වන්නේ මාඕ සේ-තුංලා, හෝ චි මිංලා සහ කැස්ත්‍රෝලා නොවන බව අපට සහතික ය. ඒ වෙනුවට කම්කරුවන් හා තරුනන් අතර දියුනු කොටස් පාඩම් ඉගෙන ගන්නවා ඇත්තේ කීර්ති බාලසූරියගෙන්, විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයෙන් හා ජාත්‍යන්තර කමිටුවෙනි.

කීර්ති සහෝදරයාගේ ජීවිතය මගින් ජාත්‍යන්තර කමිටුව මහත් වූ ඓතිහාසික වැදගත්කමක් ඇති නායකයෙකු නිර්මානය කලේ ය. පුද්ගලයෙකු ලෙස කීර්ති සහෝදරයා විස්ථාපනය කල නොහැකි ය. එහෙත් ඔහු ගොඩ නැංවූ ව්‍යාපාරය ජීවත් වෙයි. එය එලඹෙන කාල පරිච්ඡේදයෙහි දශලක්ෂ සංඛ්‍යාවන්ට විප්ලවීය ප්‍රදීපස්තම්භයක් වනු ඇත.

කීර්ති සහෝදරයා පිලිබඳ මතක දිගු කල් දිනේවා! විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය දිගු කල් දිනේවා! හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව දිගු කල් දිනේවා!

© www.wsws.org